# සිංහල භාෂාව හා සාහිත්‍යය

# මිහිලිය නළලේ අංජන තිලකේ

ශ්‍රේණිය : 11

වාරය : දෙවන වාරය

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.3 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.

## ...ක්‍රියාකාරකම්...

(1) පාඩම ඇසුරෙන් පිළිතුරු සපයන්න.

I. දේශප්‍රේමය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
.......................................................................................................................................

II. දේශාභිමානී හැඟීම් ප්‍රකාශයට පත් කෙරෙන ප්‍රධාන මාර්ගයක් සඳහන් කරන්න.
.......................................................................................................................................

III. දේශාභිමානී හැඟීම් ඉස්මතු කෙරෙමින් නිර්මාණකරණයෙහි නිරත වූ නිර්මාණකරුවන් පස් දෙනෙකු නම් කරන්න.
.......................................................................................................................................

IV. “ලංකා ලංකා පෙම්බර ලංකා" ගීතයේ පද රචකයා නම් කරන්න.
.......................................................................................................................................

V. මෙම ගීතයේ මුල් ගායකයා කවු ද?
.......................................................................................................................................

(2) ගීතයේ සඳහන් පරිදි දේශය ඔපවත් කළ පුද්ගලයන් සහ වස්තූන් හඳුනාගෙන පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| රජවරුන් | පඬුවන් | කිවියන් | ගංගා | කඳු | වතු |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(3)

I. ගීතයේ ඇතුළත් අර්ථාලංකාර දෙකක් නම් කරන්න.

.......................................................................................................................

II. ඒ සඳහා නිදසුන් සපයන්න.

.......................................................................................................................

III. ශබ්දාලංකාර දෙකක් නම් කරන්න.

.......................................................................................................................

IV. ඒ සඳහා නිදසුන් සපයන්න.

.......................................................................................................................

V. මෙහි ඇතුළත් විශේෂ භාෂා ලක්ෂණයක් නම් කරන්න.

.......................................................................................................................

(4)පහත සඳහන් ගී පදවල අදහස ලියන්න.

I. “ඔබ රැකුණොත් ලෝ කුඹු ව ද අප හට සීත ගඟුලි ලංකා”

.......................................................................................................................

II. “ඔබ වෙනුවෙන් එන වෙඩි සැර මල් පෙති සේ සලකමු ලංකා”

.......................................................................................................................

III. “ඔබ හට අත පොවනට උන්- මුන් හට ඉඩ  නොතබමු ලංකා”

.......................................................................................................................

IV. “අවසනැ ඔබට මැ පොහොරට මේ කය මෙහි  මැ හොවමු ලංකා”

.......................................................................................................................

(5)

I. “මිහිලිය නළලේ අංජන තිලකේ” යන ගීතයේ ගීත රචකයා නම් කරන්න.

.......................................................................................................................

II. එම ගීතය ගායනා කරන ගායකයා නම් කරන්න.

.......................................................................................................................

III. මෙම නිර්මාණයෙහි මාතෘභූමිය හැඳින්වීමට  යොදා ඇති යෙදුම් දෙකක් දක්වන්න.

.......................................................................................................................

IV. ගීතයේ ඇතුළත් රූපකාර්ථවත් යෙදුම නම් කරන්න.

.......................................................................................................................

V. අනුප්‍රාසය පළ කරන යෙදුම් දෙකක් උපුටා දක්වන්න.

.......................................................................................................................

(6) පහත සඳහන් වචන සඳහා ගීතයේ දැක්වෙන වචන ලියන්න

| | |
|---|---|
| I. පොළොව :......................................... | VII. ශූර: ...................................................... |
| II. වෛද්‍යා: ........................................... | VIII. මිනිස්: .................................................. |
| III. කාන්තාව:......................................... | IX. බාහු: ...................................................... |
| IV. සංග්‍රහ:............................................. | X. චන්ද්‍රයා: .................................................. |
| V. ශරීරය:............................................. | XI. දිවයින: .................................................. |
| VI. දිශා: ................................................ | XII. ජනයා: .................................................. |

(7)පළමු තීරුවේ දැක්වෙන වචන අයත් වන වියරණ හෝ භාෂා නාමය දෙ වැනි තීරුවෙන් තෝරා යා කරන්න.

| | |
|---|---|
| I. ඔබ ,අප | I. අසම්භාව්‍ය ක්‍රියා |
| II. ඉපදේවා! , හිනැහේවා! | II. ආශිර්වාද ක්‍රියා |
| III. සුපුන් ,සුරකිමු | III. පූර්වක්‍රියා |
| IV. නළවන ,එන | IV. වර්තමාන කෘදන්ත |
| V. කිරිපැණි , සිවුදිග | V. උපසර්ග සහිත පද |
| VI. පෙළ , කැල | VI. සමාස |
| VII. සේ , ලෙද | VII. සමූහාර්ථවාචී පද |
| VIII. හනාලා , දමාලා | VIII. සර්වනාම |
| IX. කිවියන් , ගුරුන් | IX. සමානාර්ථයේ නිපාත |
| X. අවහොත්, රැකුණොත් | X. අනුක්ත නාම පද |

# පිළිතුරු

(1).

I. පුරවැසියෙකුට සිය මවුබිම, ජන්මභූමිය කෙරෙහි ඇති වෙන ආදරය
II. සාහිත්‍ය නිර්මාණ
III. ඇස්. මහින්ද හිමි, ආනන්ද රාජ කරුණා, කුමාරතුංග මුනිදාස, අරිසෙන් අහුබුදු, මහගමසේකර
IV. අරිසෙන් අහුබුදු
V. සුනිල් සාන්ත

(2)

රජවරුන් :- බලි, තරු, රාවණ, ගැමුණු, විජයබා

පඬුවන් :- පුලතිසි, දැමි, සිරි රහල්, කුමරතුඟු

කිවියන් :- විදුසක්විති , මහ පැරකුම් , කිවිසුරු

ගංගා :- මහවැලි, කළු, කැලණි, වලවේ

කඳු :- සමනොළ, කිරිගල්, පිදුරුතලාගල

වතු :- තේ වතු , පොල්වතු , කෙත්වතු

(3)

I. * උපමාලංකාර
 * උත්ප්‍රේක්ෂාලංකාර
 * රූපකාලංකාර

II. * වෙඩිසැර මල් පෙති සේ (උපමා)
 * තේවතු පොල් වතු කෙත් වතු පෙළ උකුළේ නළවන ලංකා (උත්ප්‍රේක්ෂාලංකාර )
 * මහවැලි කළු කැලණි වලවේ අත් හතරක්

III. අනුප්‍රාසය
එළිවැට

IV. තේ වතු , පොල්වතු , කෙත්වතු ,
ලංකා (එළිසමය)

V. ඇකාර භාවිතය

(4)

I. සිරිලක් මව රැකේ නම් අපාය වුවද අපට සුවදායක ය.
II. ලක්මව වෙනුවෙන් වෙඩි සැරයට පවා සතුටින් මුහුණ දිය හැකි ය.
III. ලක්මවට අවැඩක් කිරීමට කිසි කෙනෙකුට ඉඩ නොදෙන බව.
IV. අප මිය ගිය පසු ශරීරය මව්බිමේ පොහොරට යොදන බව.

(5)

I. සුනිල් ආරියරත්න

II. ඩබ්ලිව්. ඩී. අමරදේව

III. සිරිලංකා දෙරණ, හෙළබිම, රන් දිව

IV. මිහිලිය නළලේ අංජන තිලකේ

V. * බුජ බල පල කළ සුරු නර විරු කැල

   * සත සිත ගත

| | |
|---|---|
| I. දෙරණ | VII. සුරු |
| II. වෙද | VIII. නර |
| III.ලිය | IX. බුජ |
| IV.සඟරා | X. සඳ |
| V.ගත | XI. දිව |
| VI.දිග | XII. දන |

(7)

I. - VIII

II. - II

III. - V

IV. - IV

V. - VI

VI. - VII

VII. - IX

VIII. - III

IX. - X

X. - I